(හයවැනි පාර්ලිමේන්තුව — සිව්වැනි සභාවාරය)

අංක. 1(6).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2009 අගෝස්තු මස 21 වැනි සිකුරාදා**

---

**2009 සැප්තැම්බර් මස 08 වැනි අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0097/'09

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) අතිගරු ජනාධිපතිතුමාගේ උපදේශකයින් ලෙස බඳවාගෙන ඇති මුළු සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ බඳවාගෙන ඇති අයගේ නම්, ලිපිනයන්, අධ්‍යාපන සුදුසුකම් හෝ විශේෂ සුදුසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම උපදේශකයින් සඳහා වැටුප් හෝ දීමනාවක් ලබා දෙන්නේද;

(ii) එසේ නම්, 2008 වර්ෂය සඳහා එක් එක් අය වෙත කොපමණ මුදලක් වෙන වෙනම ගෙවා තිබේද;

(iii) උපදේශකයින් ලෙස බඳවාගෙන ඇති පුද්ගලයින් සියලු දෙනා වෙනුවෙන් 2008 වර්ෂයේදී ගෙවා ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0216/'09

ගරු ජේමසිරි මානගේ මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පරිපාලන කටයුතු සඳහා ඉන්ටකොන්ටිනෙන්ටල් හෝටලය කුලී පදනම මත හෝ බදු පදනම මත ලබාගැනීමට අපේක්ෂා කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඒ සඳහා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර තිබේද;

(ii) එසේ නම්, ඒ කවදාද;

(iii) ඉන්ටකොන්ටිනෙන්ටල් හෝටලය ගැනීමට වෙන්කර තිබෙන මුදල කොපමණද;

(iv) එම මුදල සොයා ගන්නේ කෙසේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0224/'09

ගරු ජේමසිරි මානගේ මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) "පෙතඩීන්" එන්නත් මෙරටට ගෙන්වීමට ඇණවුම් කළේ කවදාද;

(ii) ඒ කොපමණ ප්‍රමාණයක්ද;

(iii) "පෙතඩීන්" එන්නත් රජයේ රෝහල්වලට ලබාදීම ආරම්භ කළේ කවදාද;

(iv) "පෙතඩීන්" එන්නත් භාවිත නොකර ඉතිරිව තිබෙන ප්‍රමාණය කොපමණද;

(v) "පෙතඩීන්" එන්නත් අපතේ යාමෙන් සිදුවූ මූල්‍යමය පාඩුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) "මොපීන්" එන්නත් මෙරටට ගෙන්වීමට ඇණවුම් කළේ කවදාද;

(ii) ඒ කොපමණ ප්‍රමාණයක්ද;

(iii) "මොපීන්" එන්නත් රජයේ රෝහල්වලට බෙදාහැරීම ආරම්භ කළේ කවදාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0089/'09

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දුම්රිය මාර්ග හරහා වැටී ඇති මාර්ග බොහොමයක, දුම්රියෙන් සිදුවිය හැකි අනතුරු වැළැක්වීමට පියවර ගෙන නැති බව එතුමා දන්නෙහිද?

(ආ) මානව සම්පත් ආරක්ෂාව සමග බැඳී ඇති මෙම ප්‍රශ්නය නොසලකා සිටීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0090/'09

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 1977 දේශපාලන පළිගැනීම්වලට ලක්වූවන්ගේ හා 1980 ජූලි වැඩ වර්ජනයෙන් රැකියා අහිමිවූවන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රශ්නය විසඳීම සඳහා පත්කළ කමිටු කවරේද;

(ii) එම කමිටු පත්කළ දිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පත්කළ කමිටු මගින් මෙතෙක් වාර්තා හෝ විසඳුම් ලබා නොදීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) විසඳුම් නොලැබීම නිසා අසාධාරණයට ලක්ව සිටින විශ්‍රාමිකයින්ගේ ගැටළු හා ඒ සම්බන්ධව ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0451/'09

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මත්පැන් නිෂ්පාදනය කිරීම සඳහා භාවිතා කරන ස්ප්‍රීතු මෙරටට ගෙන්වන ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ආයතන, ඒවායේ අයිතිකරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ආයතන මගින් මෙරට නිෂ්පාදනය කරනු ලබන මත්පැන් වර්ග කවරේද;

(ii) මෙම මත්පැන්වල නිෂ්පාදන ධාරිතාව කොපමණද;

(iii) මෙම එක් එක් ආයතන වලින් අලෙවි කරන නිෂ්පාදන වෙනුවෙන් පළාත් සභාවට සහ මධ්‍යම රජයට වාර්ෂිකව ගෙවන බදු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) කිසියම් ආයතනයකට, 85% බද්ද රජයට හෝ අදාළ පළාත් සභාවට නොගෙවා තම නිෂ්පාදන වෙළඳ පොළෙහි අලෙවි කිරීමේ හැකියාවක් තිබේද;

(ii) මෙම 85% බද්ද ගෙවීම පැහැරහැරීම වළක්වාගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0293/'09

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2005 ජනවාරි මස 01 වැනිදා සිට 2008 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා සහ 2009 ජනවාරි මස 01 වැනි දින සිට මේ දක්වා කාලය තුළ—

(i) ලබාගත් මුළු ණය වෙනුවෙන් ගෙවිය යුතු පොළිය කොපමණද;

(ii) ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ වටිනාකම කොපමණද;

(iii) ආනයන අනුපාතයට සාපේක්ෂව සංචිත ප්‍රමාණය කොපමණද;

(iv) දරිද්‍රතා මට්ටම කොපමණද;

(v) දරිද්‍රතා මට්ටමට අඩුවෙන් උපයන පවුල් සංඛ්‍යාව කොපමණද;

(vi) ගෙවුම් ශේෂය කොපමණද;

(vii) සහනාධාර ලබන පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත (i) - (vii) අනුව, රට ප්‍රගතියක් අත්කරගෙන තිබේද, නැතහොත් පිරිහී තිබේද යන්න සාක්ෂි සහිතව එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0371/'09

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2008.02.01 දිනැති අංක 1535 දරන ගැසට් නිවේදනය අනුව, විභාග දෙපාර්තමේන්තුව විසින් රියදුරු උපදේශකයන් ලියාපදිංචි කිරීම සඳහා වන ලිඛිත විභාගය 2008.04.26 වැනි දින පැවැත්වූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ලිඛිත විභාගය සඳහා අයදුම් කළ අයදුම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම විභාගය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) රියදුරු උපදේශකයන් ලියාපදිංචි කිරීමේ ලිඛිත විභාගයෙන් සමත්වූ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත විභාගය සමත්වූ අයගේ නම්, ලිපිනයන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) මේ වනවිට රියදුරු උපදේශකයන් ලෙස ලියාපදිංචි කර ඇති සංඛ්‍යාව හා ඔවුන්ගේ නාම ලේඛනය එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඉ) රියදුරු උපදේශකයන් ලෙස ලියාපදිංචි කිරීමේ පදනම කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

0491 /09

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර වත්කම් හි ආයෝජනය කරන ලෙස 2009 ජනවාරි මස 01 වැනි දින මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා වශයෙන් මෙන්ම අතිගරු ජනාධිපතිතුමා වශයෙන් විදේශයන්හි ජීවත් වන ශ්‍රී ලාංකිකයින්ගෙන් හා සංක්‍රමික ශ්‍රමිකයින් වශයෙන් රැකියාවල නිරත වූවන්ගෙන් ඉල්ලා සිටින ලද ලිපියට අනුව, මේ වනවිට කොපමණ ශ්‍රී ලාංකිකයින් සංඛ්‍යාවක් මෙම ආයෝජන අවස්ථා සඳහා ලියාපදිංචි වී තිබේද;

(ii) එය දැනට විදේශයන්හි පදිංචි හා සංක්‍රමික රැකියාවල නිරත ශ්‍රී ලාංකිකයින්ගෙන් කොපමණ ප්‍රමාණයක්ද;

(iii) ඒ අනුව භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කිරීමෙන් මෙරටට ලැබී ඇති විදේශ මූල්‍ය වත්කම් ප්‍රමාණය කොපමණද;

(iv) භාණ්ඩාගාර බැඳුම්කරයන්හි කරන ලද ආයෝජනයන්ගෙන් ලැබී ඇති විදේශ මූල්‍ය වත්කම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0063/’09

ගරු රවි කරුණානායක මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන්සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ගුවන් යානා සහ නැව්වලට ශ්‍රී ලංකාවේ ලියාපදිංචිවීමට 2008.01.01 දින සිට ක්‍රියාත්මක වූ අය-වැය ලේඛනයෙන් සහන සලසා තිබූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2007.12.31 දින දක්වා ලියාපදිංචි වූ නැව් සහ ගුවන් යානා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙම සහන සැලසීමෙන් අනතුරුව, එලෙස ලියාපදිංචි වූ නැව් සහ ගුවන් යානා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම සහන සැලසීම නිසා අහිමිවූ ආදායම් ප්‍රමාණය කොපමණද;

(iv) එලෙස වෙනත් රටක පහසුකම් මත ලියාපදිංචිවීමේ සහනය ලබාදීම තුළින් අප ලබාගත් ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම සහන ලබාදීමෙන් අනතුරුව ලියාපදිංචි කරන ලද නැව් සහ ගුවන්යානා හිමිකරුවන්ගේ සහ කොටස්කරුවන්ගේ නම් කවරේද;

(ii) මෙහිදී ලබාගත් ප්‍රගතියේ මට්ටමට වඩා වැඩියෙන් ආකර්ෂණය කරගැනීමට නොහැකිවූයේ මන්ද;

යන්න එතුමා ප්‍රකාශ කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 105— වැඩසටහන 02,—† 2009 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2009 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් මිලියන නවසියයකට (රු. 900,000,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය | 105 | — | ජාතිය ගොඩනැගීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අමාත්‍යාංශය |
| වැඩ සටහන | 02 | — | සංවර්ධන කාර්යයන් |
| ව්‍යාපෘතිය | 01 | — | අමාත්‍යාංශ ප්‍රධාන කාර්යාලය |
| | | පුනරාවර්තන වියදම් | රු. 900,000,000 |
| | | | රු. 900,000,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

† 2009 අගෝස්තු මස 18 වැනි දින ඉදිරිපත් කරන ලද 2009 අංක 12 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 11 දක්වා එකතුව රු. 19,530,903,938.

*

කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 285— වැඩසටහන 01,—† 2009 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2009 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් හැටඅට කෝටි පනස්තුන් ලක්ෂ අනූතුන් දහස් නවසිය තිස් අටක් (රු. 68,53,93,938) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය | 285 | — | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| වැඩ සටහන | 01 | — | මෙහෙයුම් වැඩසටහන |
| ව්‍යාපෘතිය | 01 | — | පරිපාලන හා ආයතන සේවා |

පුනරාවර්තන වියදම් රු. 68,53,93,938
රු. 68,53,93,958

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

† 2009 අගෝස්තු මස 18 වැනි දින ඉදිරිපත් කරන ලද 2009 අංක 11 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 10 දක්වා එකතුව රු. 18,845,510,000.

*

ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග,— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61 වැනි වගන්තිය යටතේ ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2008 ඔක්තෝබර් මස 09 දිනැති, අංක 1570/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.08.18 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

*

කැළෑ (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*

පතල් හා ඛණිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

## (2009 සැප්තැම්බර් මස 08 වැනි අඟහරුවාදා)

0440/'09

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) මධ්‍යම පළාත් සභා මැතිවරණ රාජකාරි සඳහා යෙදවූ ඡන්ද මධ්‍යස්ථාන භාර නිලධාරීන්ගේ නාම ලේඛනය, එම නිලධාරීන් සේවය කරන ආයතන සහ තනතුරු මාතලේ, මහනුවර සහ නුවරඑළිය දිස්ත්‍රික්කයනට අදාළව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) වයඹ පළාත් සභා මැතිවරණ රාජකාරි සඳහා යෙදවූ ඡන්ද මධ්‍යස්ථාන භාර නිලධාරින්ගේ නාම ලේඛනය, එම නිලධාරීන් සේවය කරන ආයතන, තනතුරු හා දිස්ත්‍රික්ක ලෙස වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) මධ්‍යම හා වයඹ මැතිවරණ දිනයන්හි ක්‍රියාත්මක වූ පරිගණක කාර්යාලයේ නිලධාරින්ගේ නම්, තනතුරු සහ ආයතන වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0022/'09

ගරු රවි කරුණානායක මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) මේ දක්වා වූ පසුගිය වසර 4ක කාලය තුළ එක් එක් වර්ෂයේදී, වරාය හා ගුවන් සේවා අමාත්‍යාංශය විසින් සහ එම අමාත්‍යාංශයට අයත් ඕනෑම සමාගමක් සඳහා කුලියට ගත් එක් එක් වාහනය වෙනුවෙන් ගෙවන ලද මුළු මුදල හා කුලියට ලබා ගත් කාර්යාලයීය ඉඩකඩ සඳහා ගෙවන ලද මුළු මුදල කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) උක්ත කාල සීමාව තුළ —

(i) ඉහත කී වාහන සඳහා ඉන්ධන වෙනුවෙන් වැය කළ මුදල කොපමණද හා එම මුදල අමාත්‍යාංශයේ සමස්ත පුනරාවර්තන වියදම් වලින් කුමන ප්‍රතිශතයක්ද;

(ii) ඉහත සඳහන් කාර්යාලයීය ඉඩකඩ සඳහා එක් වර්ග අඩියක් වෙනුවෙන් වැය කළ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) කල්බදු ක්‍රමය යටතේ එම ගොඩනැගිල්ල ලබා ගෙන ඇත්තේ කොපමණ කාලයක් සඳහාද හා තැන්පතුවක් ලෙස අත්තිකාරම් වශයෙන් ගෙවන ලද මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2009 සැප්තැම්බර් මස 09 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0225/'09

ගරු ප්‍රේමසිරි මානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 1986 - 2000 වර්ෂය දක්වා කාලය තුළ පුද්ගල අතුරුදහන්වීම් සිදු වූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම කාලය තුළ, එක් එක් දිස්ත්‍රික්කයේ අතුරුදහන්වීම්වලට ලක් වූ පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම අතුරුදහන්වීම්වලට අදාළව නඩු පවරා තිබෙන සංඛ්‍යාව කොපමණද;

(iii) එම නඩු සඳහා තීන්දු ලබා දී තිබෙන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0226/'09

ගරු ප්‍රේමසිරි මානගේ මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) "උදාවූ යෞවනය" නමින් පොත් 25,000 ක් මුද්‍රණය කළ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පොත් මුද්‍රණය කිරීමට වැයකළ මුදල කොපමණද;

(ii) ඉහත පොත් ගබඩාවට ලැබීමට ප්‍රථම මුදල් ගෙවීම සිදු කළේ කෙසේද;

(iii) එම පොත් බෙදාහැරීම සිදු කර තිබෙන්නේ කවර පාර්ශ්වයන්ටද;

(iv) ඒ කොපමණ ප්‍රමාණයක්ද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0227/'09

ගරු ජේමසිරි මානගේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2008.12.31 දිනට ලංකා ධීවර සංස්ථාව සතුව පැවති, ගාල්ල ධීවර වරායේ අයිස් යන්ත්‍රාගාර සංඛ්‍යාව කොපමණද;

(ii) එකී අයිස් යන්ත්‍රාගාර අලෙවි කිරීමට හෝ බදුදීමට පුවත්පත් දැන්වීමක් පළ කරනු ලැබුවේද;

(iii) එසේ නම්, ඒ කවදාද;

(iv) එකී අයිස් යන්ත්‍රාගාර මේ වන විට විකුණා තිබේද, නොඑසේ නම්, ඒවා බද්දට දී තිබේද;

(v) එම අයිස් යන්ත්‍රාගාර විකුණනු ලැබුවේ නම්, ඒ කොපමණ මුදලකටද;

(vi) ඒවා මිල දී ගනු ලැබූ පුද්ගලයින්ගේ නම් හා ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0400/'09

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් ඉඩම්, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට බදු ගිවිසුම් යටතේ තෙල් පිරවුම්හල් සඳහා බදු දී තිබේ ද;

(ii) එවැනි ඉඩම් තුල පිරවුම්හල් කොපමණ සංඛ්‍යාවක් තිබේ ද;

(iii) ඒවා අතර අයි. ඕ. සී. සමාගම යටතේ ඇති පිරවුම්හල් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උක්ත බදු ගිවිසුම් යටතේ බදු දීමෙන් දුම්රිය දෙපාර්තමේන්තුවට අයවිය යුතු හිඟ බදු මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) යාවත්කාලීන නොකරන ලද බදු ගිවිසුම් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0113/'09

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— ජාතිය ගොඩනැඟීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ජාතිය ගොඩනැඟීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය යටතේ, කලාප අංක 04 යටතට ගැනෙන ගාල්ල, හම්බන්තොට, කිලිනොච්චිය දිස්ත්‍රික්කවල සමාජ සුභ සාධන ව්‍යාපෘති සඳහා 2006, 2007, 2008 සහ 2009 වර්ෂ සඳහා වෙන වෙනම කොපමණ මුදලක් වෙන්කර තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත ව්‍යාපෘතීන් හි වැඩ අවසන් කර තිබේනම්, වැඩ ආරම්භ කළ දිනය, වැඩ අවසන් කළ දිනය, ඇස්තමේන්තුගත මුදල හා ගෙවා ඇති මුළු මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත ව්‍යාපෘති යටතේ ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2009 වර්ෂය සඳහා තෝරාගෙන ඇති ව්‍යාපෘති හා ඇස්තමේන්තු මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0441/'09

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) මාතලේ දිස්ත්‍රික්කය තුළ 2008 සහ 2009 වර්ෂවල ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ විශේෂ විදුලි ව්‍යාපෘති කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ව්‍යාපෘති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම ව්‍යාපෘතිය සඳහා වෙන් වූ මුදල කොපමණද;

(iii) එම ව්‍යාපෘතීන් හී වැඩ අවසන් කිරීමට නියමිත දිනය කවදාද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0492 /'09

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) විදේශයන්හි ජීවත් වන ශ්‍රී ලාංකිකයින්ට හා සංක්‍රමික ශ්‍රමිකයින් වශයෙන් රැකියාවල නිරතවූවන්ට භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර වත්කම් හි ආයෝජනය කරන ලෙස ආරාධනා කිරීම සඳහා කොපමණ දූත කණ්ඩායම් සංඛ්‍යාවක් මෙරටින් විදේශයන් කරා යවන ලද්දේ ද;

(ii) එම දූත කණ්ඩායම්වලට ඇතුළත් වූ සංඛ්‍යාව කොපමණද;

(iii) එම දූත පිරිසට අයත් වූවන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(iv) ඔවුන්ගේ ගුවන් ගමන්, නවාතැන් පහසුකම් හා වෙනත් කටයුතු සඳහා දරන ලද වියදම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත වැඩසටහනේ වෙනත් ප්‍රචාරක කටයුතු සඳහා දේශීය හා විදේශීය වශයෙන් දරන ලද වියදම් ප්‍රමාණය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0504/'09

ගරු චන්දිම වීරක්කොඩි මහතා,— වෙළෙඳ, අලෙවි සංවර්ධන, සමූපකාර හා පාරිභෝගික සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) සීමාසහිත අධ්‍යාපන සේවකයන්ගේ සකසුරුවම් හා ණය ගනුදෙනු සමූපකාර සමිතියේ අවසන් මහා සභා රැස්වීම පැවැත්වූ දිනය කවදාද;

(ii) මෙම මහා සභා රැස්වීමේ න්‍යාය පත්‍රයේ සඳහන් සීමාසහිත අධ්‍යාපන සේවකයන්ගේ සකසුරුවම් හා ණය ගනුදෙනු සමූපකාර සමිතියට අයත්, විකිණීමට යෝජනා කර තිබෙන ඉඩමෙහි නම කවරේද;

(iii) එම ඉඩම පිහිටා තිබෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය කවරේද;

(iv) අදාළ ඉඩමේ ප්‍රමාණය කොපමණද,

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0525/'09

ගරු වයි. එම්. නවරත්න බණ්ඩා මහතා,— ප්‍රජා සංවර්ධන හා සමාජ විෂමතා දුරලීමේ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2005, 2006, 2007, 2008 සහ 2009 යන වර්ෂ සඳහා ඒ අදාළ අමාත්‍යාංශයට අයවැයෙන් වෙන් කළ මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) එම මුදල් ප්‍රාග්ධන හා පුනරාවර්තන ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) ඉහත වර්ෂවල වෙන්කරන ලද මුදල හා ලැබුණු මුදල අතර වෙනසක් තිබේ නම් වාර්ෂිකව ඒ කොපමණ ප්‍රමාණයක්ද;

(ii) එසේ මුදල් අඩුවී ඇත්නම් ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ප්‍රජා සංවර්ධන හා සමාජ විෂමතා දුරලීමේ අමාත්‍යාංශය යටතේ ඇති ප්‍රධාන ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0281/'09

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දුම්රිය මාර්ග පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ආරම්භ කරන ලද අඹේපුස්ස ගල්වල ව්‍යාපෘතිය සඳහා මිල දී ගත් පුපුරණ ද්‍රව්‍ය තොගයක් පාවිච්චියට ගත නොහැකිව විනාශ කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) විනාශකර ඇති එම පුපුරන ද්‍රව්‍ය තොගයේ මූල්‍යමය වටිනාකම හා එකී ද්‍රව්‍ය විනාශ කළ දිනය කවරේද;

(ii) එවැනි තොගයක් මිලදී ගැනීමට හා පසුව පාවිච්චියට නොගෙන විනාශ කිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0067/'09

ගරු රවි කරුණානායක මහතා,— ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යතුමා සහ ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) වර්තමානයේදී රජයේ රූපවාහිනී ප්‍රචාරණ ආයතන සහ පෞද්ගලික සමාගම්වලට රූපවාහිනී ප්‍රචාරණය සඳහා බලපත්‍ර නිකුත් කරනු ලබන්නේ දැනට ක්‍රියාත්මක ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා (ශ්‍රී. ල. රූ. ස.) පනත යටතේ බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවද දැනට ක්‍රියාත්මක ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත යටතේ නියාමනය වී ක්‍රියාත්මක වන්නක් වන බැවින්, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත යටතේ බලපත්‍ර නිකුත් කිරීම අනෙක් බලපත්‍රලාභීන්ට හා අයදුම්කරුවන්ට අසාධාරණයක් වන අතර සාධාරණ වෙළඳාම හා සම අවස්ථා සැලකීමේදී ලෝක වෙළඳ සංවිධානය (W.T.O.) සහ අනෙකුත් ජාත්‍යන්තර සංවිධාන සමග අත්සන් කරන ලද ගිවිසුම් උල්ලංඝණය කිරීමක්ද වන බව ගරු අමාත්‍යතුමා දන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) වර්තමානයේදී රූපවාහිනී ප්‍රචාරක බලපත්‍ර නිකුත් කිරීමට යොදා ගැනෙන දැනට ක්‍රියාත්මක ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනතේ අදාළ විධිවිධාන අවලංගු කර එම විධිවිධාන දැනට ක්‍රියාත්මක ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත යටතේ හෝ ඒ හා සමාන පනතක් යටතේ යළි හඳුන්වා දීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0087/'09

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) වර්තමාන රජයේ, ආරක්ෂක අමාත්‍යවරයාගේ ධූර කාලය තුළ පොලිස් අත්අඩංගුවට පත්ව සිටියදී මිය ගොස් ඇති සැකකරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එකී සැකකරුවන්ගේ නම් කවරේද;

(iii) ඒ ඒ සැකකරුවන් මියගොස් ඇති ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

## (2009 සැප්තැම්බර් මස 09 වැනි බදාදා)

0410/'09

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ, විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි පුරප්පාඩු සඳහා මෑතක දී පවත්වන ලද ග්‍රාම නිලධාරීන් බඳවා ගැනීමේ තරඟ විභාගයට ඉදිරිපත් වූ අපේක්ෂකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම තරඟ විභාගයෙන් සමත් වූ සංඛ්‍යාව කොපමණද;

(iii) එම සමත් වූ අයගේ නම් සහ ලබාගත් ලකුණු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අය අතුරින් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ අයගේ නම් කවරේද;

(ii) එම අය සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගත් ලකුණු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම සම්මුඛ පරීක්ෂණයෙන් පත්වීම් ලබාදුන් අයගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) තවත් කොපමණ ග්‍රාම නිලධාරි පුරප්පාඩු සංඛ්‍යාවක් මෙම කොට්ඨාසය තුළ ඉතිරිව තිබේද;

(ii) මෙම පුරප්පාඩු පිරවීම සඳහා ඉදිරියේදී ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0411/'09

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ, ලග්ගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි පුරප්පාඩු සඳහා මෑතක දී පවත්වන ලද ග්‍රාම නිලධාරීන් බඳවා ගැනීමේ තරඟ විභාගයට ඉදිරිපත් වූ අපේක්ෂකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම තරඟ විභාගයෙන් සමත් වූ සංඛ්‍යාව කොපමණද;

(iii) එම සමත් වූ අයගේ නම් සහ ලබාගත් ලකුණු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අය අතුරින් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ අයගේ නම් කවරේද;

(ii) එම අය සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගත් ලකුණු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම සම්මුඛ පරීක්ෂණයෙන් පත්වීම් ලබාදුන් අයගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) තවත් කොපමණ ග්‍රාම නිලධාරි පුරප්පාඩු සංඛ්‍යාවක් මෙම කොට්ඨාසය තුළ ඉතිරිව තිබේද;

(ii) මෙම පුරප්පාඩු පිරවීම සඳහා ඉදිරියේදී ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0412/'09

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ, දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි පුරප්පාඩු සඳහා මෑතක දී පවත්වන ලද ග්‍රාම නිලධාරීන් බඳවා ගැනීමේ තරඟ විභාගයට ඉදිරිපත් වූ අපේක්ෂකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම තරඟ විභාගයෙන් සමත් වූ සංඛ්‍යාව කොපමණද;

(iii) එම සමත් වූ අයගේ නම් සහ ලබාගත් ලකුණු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අය අතුරින් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ අයගේ නම් කවරේද;

(ii) එම අය සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගත් ලකුණු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම සම්මුඛ පරීක්ෂණයෙන් පත්වීම් ලබාදුන් අයගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) තවත් කොපමණ ග්‍රාම නිලධාරි පුරප්පාඩු සංඛ්‍යාවක් මෙම කොට්ඨාසය තුළ ඉතිරිව තිබේද;

(ii) මෙම පුරප්පාඩු පිරවීම සඳහා ඉදිරියේදී ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0413/'09

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ, නාඋල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි පුරප්පාඩු සඳහා මෑතක දී පවත්වන ලද ග්‍රාම නිලධාරීන් බඳවා ගැනීමේ තරඟ විභාගයට ඉදිරිපත් වූ අපේක්ෂකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම තරඟ විභාගයෙන් සමත් වූ සංඛ්‍යාව කොපමණද;

(iii) එම සමත් වූ අයගේ නම් සහ ලබාගත් ලකුණු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අය අතුරින් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ අයගේ නම් කවරේද;

(ii) එම අය සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගත් ලකුණු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම සම්මුඛ පරීක්ෂණයෙන් පත්වීම් ලබාදුන් අයගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) තවත් කොපමණ ග්‍රාම නිලධාරි පුරප්පාඩු සංඛ්‍යාවක් මෙම කොට්ඨාසය තුළ ඉතිරිව තිබේද;

(ii) මෙම පුරප්පාඩු පිරවීම සඳහා ඉදිරියේදී ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0414/'09

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ, උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි පුරප්පාඩු සඳහා මෑතක දී පවත්වන ලද ග්‍රාම නිලධාරීන් බඳවා ගැනීමේ තරඟ විභාගයට ඉදිරිපත් වූ අපේක්ෂකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම තරඟ විභාගයෙන් සමත් වූ සංඛ්‍යාව කොපමණද;

(iii) එම සමත් වූ අයගේ නම් සහ ලබාගත් ලකුණු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අය අතුරින් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ අයගේ නම් කවරේද;

(ii) එම අය සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගත් ලකුණු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම සම්මුඛ පරීක්ෂණයෙන් පත්වීම් ලබාදුන් අයගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) තවත් කොපමණ ග්‍රාම නිලධාරි පුරප්පාඩු සංඛ්‍යාවක් මෙම කොට්ඨාසය තුළ ඉතිරිව තිබේද;

(ii) මෙම පුරප්පාඩු පිරවීම සඳහා ඉදිරියේදී ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0415/'09

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ, යටවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි පුරප්පාඩු සඳහා මෑතක දී පවත්වන ලද ග්‍රාම නිලධාරීන් බඳවා ගැනීමේ තරඟ විභාගයට ඉදිරිපත් වූ අපේක්ෂකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම තරඟ විභාගයෙන් සමත් වූ සංඛ්‍යාව කොපමණද;

(iii) එම සමත් වූ අයගේ නම් සහ ලබාගත් ලකුණු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අය අතුරින් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ අයගේ නම් කවරේද;

(ii) එම අය සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගත් ලකුණු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම සම්මුඛ පරීක්ෂණයෙන් පත්වීම් ලබාදුන් අයගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) තවත් කොපමණ ග්‍රාම නිලධාරි පුරප්පාඩු සංඛ්‍යාවක් මෙම කොට්ඨාසය තුළ ඉතිරිව තිබේද;

(ii) මෙම පුරප්පාඩු පිරවීම සඳහා ඉදිරියේදී ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0416/'09

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ, අඹන්ගඟකෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි පුරප්පාඩු සඳහා මෑතක දී පවත්වන ලද ග්‍රාම නිලධාරීන් බඳවා ගැනීමේ තරඟ විභාගයට ඉදිරිපත් වූ අපේක්ෂකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම තරඟ විභාගයෙන් සමත් වූ සංඛ්‍යාව කොපමණද;

(iii) එම සමත් වූ අයගේ නම් සහ ලබාගත් ලකුණු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අය අතුරින් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ අයගේ නම් කවරේද;

(ii) එම අය සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගත් ලකුණු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම සම්මුඛ පරීක්ෂණයෙන් පත්වීම් ලබාදුන් අයගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) තවත් කොපමණ ග්‍රාම නිලධාරි පුරප්පාඩු සංඛ්‍යාවක් මෙම කොට්ඨාසය තුළ ඉතිරිව තිබේද;

(ii) මෙම පුරප්පාඩු පිරවීම සඳහා ඉදිරියේදී ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0417/'09

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ, ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි පුරප්පාඩු සඳහා මෑතක දී පවත්වන ලද ග්‍රාම නිලධාරීන් බඳවා ගැනීමේ තරඟ විභාගයට ඉදිරිපත් වූ අපේක්ෂකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම තරඟ විභාගයෙන් සමත් වූ සංඛ්‍යාව කොපමණද;

(iii) එම සමත් වූ අයගේ නම් සහ ලබාගත් ලකුණු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අය අතුරින් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ අයගේ නම් කවරේද;

(ii) එම අය සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගත් ලකුණු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම සම්මුඛ පරීක්ෂණයෙන් පත්වීම් ලබාදුන් අයගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) තවත් කොපමණ ග්‍රාම නිලධාරි පුරප්පාඩු සංඛ්‍යාවක් මෙම කොට්ඨාසය තුළ ඉතිරිව තිබේද;

(ii) මෙම පුරප්පාඩු පිරවීම සඳහා ඉදිරියේදී ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0418/’09

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි පුරප්පාඩු සඳහා මෑතක දී පවත්වන ලද ග්‍රාම නිලධාරීන් බඳවා ගැනීමේ තරඟ විභාගයට ඉදිරිපත් වූ අපේක්ෂකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම තරඟ විභාගයෙන් සමත් වූ සංඛ්‍යාව කොපමණද;

(iii) එම සමත් වූ අයගේ නම් සහ ලබාගත් ලකුණු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අය අතුරින් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ අයගේ නම් කවරේද;

(ii) එම අය සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගත් ලකුණු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම සම්මුඛ පරීක්ෂණයෙන් පත්වීම් ලබාදුන් අයගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) තවත් කොපමණ ග්‍රාම නිලධාරි පුරප්පාඩු සංඛ්‍යාවක් මෙම කොට්ඨාසය තුළ ඉතිරිව තිබේද;

(ii) මෙම පුරප්පාඩු පිරවීම සඳහා ඉදිරියේදී ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2009 සැප්තැම්බර් මස 10 වැනි බ්‍රහස්පතින්දා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0242/’09

ගරු පේමසිරි මානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රී ලංකා නීති විද්‍යාලය පිහිටුවා තිබෙන්නේ කවර පනතක් යටතේද;

(ii) වර්ෂ 2000 සිට 2007 දක්වා කාලය තුළ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ දේශන පවත්වන ලද්දේ කවර භාෂා මාධ්‍යයෙන්ද;

(iii) 2007 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ දේශන පවත්වනු ලබන්නේ කවර භාෂා මාධ්‍යයෙන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2010 වර්ෂයේ සිට ශ්‍රී ලංකා නීති විද්‍යාලයට සිසුන් බඳවා ගනු ලබන වයස් සීමාව කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0243/'09

ගරු ජේමසිරි මානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2008 ජනවාරි මාසයේ සිට 2009 මාර්තු 31 දක්වා කාලය තුළ මරණයට පත් වූ ආරක්ෂක හමුදාවල සාමාජිකයන් කොපමණ සංඛ්‍යාවක් වෙනුවෙන් වන්දි මුදල් ගෙවා තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් කාලය තුළ මරණයට පත් වූ ආරක්ෂක හමුදාවල සාමාජිකයන් වෙනුවෙන් වන්දි මුදල් ගෙවා නොමැති සංඛ්‍යාව කොපමණද;

(ii) මරණයට පත්වන හමුදා සාමාජිකයෙකුට ගෙවන වන්දි මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) අදාළ වන්දි මුදල් ගෙවීම ප්‍රමාද වීමට හේතුව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0184/'09

ගරු ජේමසිරි මානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) "මහින්ද චින්තනය" නමින් ප්‍රතිපත්ති ප්‍රකාශයක් නිකුත්කර තිබෙන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) "මහින්ද චින්තනය" නමැති මුද්‍රිත ප්‍රකාශනය තුළ අන්තර්ගත යෝජනා සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතුරින් මේවන විට ක්‍රියාත්මක කර තිබෙන යෝජනා සංඛ්‍යාව කොපමණද;

(iii) ඉතිරි යෝජනා ක්‍රියාත්මක කිරීමට කොපමණ කාලයක් ගතවේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0279/'09

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2007 වර්ෂයේ දී ප්‍රධාන දුම්රිය පීලි පැනීම් 63ක් හා අනෙකුත් දුම්රිය පීලි පැනීම් 142 ක් වාර්තා වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) එමගින් සිදු වී ඇති ශාරීරික හානි හා භෞතික අලාභයන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) එවැනි තත්ත්වයක් ඇති වීමට හේතු කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0280/'09

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) දුම්රිය දෙපාර්තමේන්තුව මගින් පෞද්ගලික සමාගමක් වෙත තිරිංග මැදිරි තුනක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම සමාගමේ නම, ලිපිනය හා තිරිංග මැදිරි ලබාදුන් දිනය කවරේද;

(iii) ඒවා ලබා දී ඇති පදනම හෝ අදාළ ගිවිසුම කවරේද;

(iv) එම ගිවිසුම් වලට අනුව අදාළ දෙපාර්තමේන්තුවට මුදල් ගෙවා තිබේද;

(v) අදාළ මුදල් නොගෙවීම නිසා දෙපාර්තමේන්තුවට සිදු වී ඇති පාඩුවේ මූල්‍යමය වටිනාකම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0379/'09

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 9 වැනි පිටුවේ (සිංහල මාධ්‍ය) යෝජනා කර ඇති පරිදි, පෙර පාසල් පාලිකාවන්ට අවශ්‍ය තාක්ෂණික පුහුණුව හා මූල්‍ය පහසුකම් මාසිකව සැපයීම මේ වන විට ක්‍රියාත්මක කර තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දැනට එම පුහුණුව හා මූල්‍ය පහසුකම් ලබාදීම ක්‍රියාත්මක වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(ii) ඒ අනුව, මෙම තාක්ෂණික පුහුණුව හා මූල්‍ය පහසුකම් ලබාදී ඇති සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0432/'09

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් රජය සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් කට්ටි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ඉඩම් අතුරින් දැනට පෞද්ගලික අංශයට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) එසේ ලබා දී ඇත්තේ කවර අය වෙතද;

(v) මෙම ඉඩම් ලබාදීම සඳහා අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0505/'09

ගරු චන්දිම වීරක්කොඩි මහතා,— වෙළඳ, අලෙවි සංවර්ධන, සමුපකාර හා පාරිභෝගික සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) සීමාසහිත අධ්‍යාපන සේවකයන්ගේ සකසුරුවම් හා ණය ගනුදෙනු සමුපකාර සමිතියේ අධ්‍යක්‍ෂ මණ්ඩලය පිහිටුවූ දිනය කවදාද;

(ii) මෙම සමිතියේ සම්පූර්ණ අනුමත සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) වර්තමානයේ පවතින පුරප්පාඩු හා අතිරික්ත සේවක සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) මෑතකදී, සේවකයින් බඳවා ගැනීම සඳහා පුවත්පත් දැන්වීම් පළකර ඇති බව එතුමා දන්නෙහිද?

(ඇ) එසේනම්, එම දැන්වීම් පළ කරන ලද පුවත්පත් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) නව අධ්‍යක්ෂ මණ්ඩලය පත්වීමෙන් පසුව බඳවාගෙන ඇති සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, ලිපිනයන් සහ තනතුරු කවරේද;

(iii) අදාළ සේවකයින් බඳවා ගැනීමේදී ආයතනය විසින් අනුගමනය කළ ක්‍රියාමාර්ග කවරේද,

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0388/'09

ගරු සාගල රත්නායක මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ඉහළ කොත්මලේ ජල විදුලි ව්‍යාපෘතියේ, නොරොච්චෝලේ ගල් අඟුරු ව්‍යාපෘතියේ සහ කෙරවලපිටිය බහු චක්‍රීය බලාගාරයේ මෙගා වොට් එකකට ප්‍රාග්ධන පිරිවැය (මිල දී ගැනීම් හා තැනීම් සඳහා වූ මූලධන වියදම) නවතම මිල ඉහළ නැගීම්ද සමග වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කැළණිතිස්ස පිහිටි ලං. වි. ම. ට අයත් බහු චක්‍රීය බලාගාරය;

(ii) ඒ්ඊඑස් (AES) ට අයත් බහු චක්‍රීය බලාගාරය;

(iii) කෙරවලපිටිය බහු චක්‍රීය බලාගාරය- බහු චක්‍රීය ක්‍රමයට සහ ඒක චක්‍රීය ක්‍රමයට;

(iv) යාපනයේ පිහිටි පෞද්ගලික අංශයට අයත් අයිපීපී (IPP) බලාගාරය සහ අනෙකුත් සියලුම අයිපීපී (IPP) බලාගාර;

(v) යාපනයේ පිහිටි තාවකාලික ඇග්‍රෙකෝ බලාගාරය;

(vi) ලං. වි. ම. ට අයත් හියරේ වායු ටර්බයිනය;

යන එක් එක් බලාගාරයේ ඉන්ධන යෙදවුම සහ ව්‍යාපෘතියේ සම තීරුබදු වල ඇස්තමේන්තුගත ඒකක පිරිවැය එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) කෙරවලපිටිය ව්‍යාපෘතිය සඳහා ඔවුන් විසින් ලබාගත් ණය සඳහා සීමාසහිත වෙස්ට් කෝස්ට් පවර් සමාගම විසින් එකඟවන ලද පොලී පිරිවැයද (අනුපාතිකය) එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0292/'09

ගරු රවි කරුණානායක මහතා,— සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) මේ දක්වා වූ පසුගිය වසර දහයක කාලය තුළ එක් එක් වර්ෂයේදී;

(i) ශ්‍රී ලංකාව නැරඹීමට පැමිණි සමස්ත සංචාරකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ රටවල් සහ එම සංචාරකයින් මෙරට නැවතී සිටි සාමාන්‍ය කාලසීමාව කොපමණද;

(iii) උපයාගත් මුදල සහ සංචාරකයින් විසින් දරන ලද වියදමේ සාමාන්‍ය අගය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පසුගිය වසර 10ක කාලය තුළ සෘජුව හෝ වක්‍රව සංචාරක කර්මාන්තයේ නිරතව සිටි ජනතාව කොපමණදැයි එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) මේ දක්වා වූ පසුගිය වසර දහයක කාලය තුළ එක් එක් වර්ෂයේදී;

(i) මෙරට තිබූ හෝටල් කාමර සංඛ්‍යාව කොපමණද;

(ii) එම හෝටල් අයත්වන තරු පංතිය කවරේද;

යන්න එතුමා වැඩිදුරටත් ප්‍රකාශ කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

## (2009 සැප්තැම්බර් මස 10 වැනි බ්‍රහස්පතින්දා)

0433/'09

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මාතලේ මහ නගර සහා බල ප්‍රදේශයට අයත් රජය සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් කට්ටි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ඉඩම් අතුරින් දැනට පෞද්ගලික අංශයට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) එසේ ලබා දී ඇත්තේ කවර අය වෙතද;

(v) මෙම ඉඩම් ලබාදීම සඳහා අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0434/'09

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් රජය සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් කට්ටි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ඉඩම් අතුරින් දැනට පෞද්ගලික අංශයට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) එසේ ලබා දී ඇත්තේ කවර අය වෙතද;

(v) මෙම ඉඩම් ලබාදීම සඳහා අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0435/'09

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) නාඋල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් රජය සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් කට්ටි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ඉඩම් අතුරින් දැනට පෞද්ගලික අංශයට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) එසේ ලබා දී ඇත්තේ කවර අය වෙතද;

(v) මෙම ඉඩම් ලබාදීම සඳහා අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0436/'09

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ලග්ගල - පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් රජය සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් කට්ටි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ඉඩම් අතුරින් දැනට පෞද්ගලික අංශයට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) එසේ ලබා දී ඇත්තේ කවර අය වෙතද;

(v) මෙම ඉඩම් ලබාදීම සඳහා අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0437/'09

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් රජය සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් කට්ටි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ඉඩම් අතුරින් දැනට පෞද්ගලික අංශයට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) එසේ ලබා දී ඇත්තේ කවර අය වෙතද;

(v) මෙම ඉඩම් ලබාදීම සඳහා අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0438/'09

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් රජය සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් කට්ටි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ඉඩම් අතුරින් දැනට පෞද්ගලික අංශයට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) එසේ ලබා දී ඇත්තේ කවර අය වෙතද;

(v) මෙම ඉඩම් ලබාදීම සඳහා අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0439/'09

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් රජය සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් කට්ටි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ඉඩම් අතුරින් දැනට පෞද්ගලික අංශයට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) එසේ ලබා දී ඇත්තේ කවර අය වෙතද;

(v) මෙම ඉඩම් ලබාදීම සඳහා අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2009 සැප්තැම්බර් මස 11 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0271/'09

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) "කුලී ත්‍රීරෝද රථ සේවය" අප රටේ ප්‍රවාහන සේවයේ කොටසක් බවත්;

(ii) ත්‍රී රෝද රථ සේවය විධිමත් පාලනයකට අනුව පවත්වාගෙන යා යුතු සේවයක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) නගර හා වීදිවල ත්‍රීරෝද රථ ගාල් කිරීම සම්බන්ධව සහ නව ත්‍රීරෝද රථයක් ප්‍රවාහන සේවයට එකතු වීමට අදාළව පවතින නීතිය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මෙම සේවය පවත්වාගෙන යැමට අදාළ වන විවිධ ආයතන සමග අන්තර් සම්බන්ධිත වැඩ පිළිවෙළක් තිබිය යුතු බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) රට තුළ කුලී ත්‍රීරෝද රථ ලෙස පවතින කුලී රථ සංඛ්‍යාව පිළිබඳ තොරතුරු තිබේද;

(ii) එසේ නම්, ඒ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0276/'09

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දුම්රිය දෙපාර්තමේන්තුව මගින් කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරීන් 8 දෙනෙකුට 2007 වර්ෂයේදී වැටුප් වර්ධක ලෙස රු. 586,952/- ක් ගෙවා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එකී නිලධාරීන් 8 දෙනා කවුරුන්ද;

(ii) ඔවුන් ඉටුකළ රාජකාරි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරීන්ට වැටුප් වර්ධක ගෙවීම නිවැරදි ද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0278/'09

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) පළාත් සභාවල පවත්වාගෙන යන විපක්ෂනායක, සභානායක, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක සහ විපක්ෂයේ ප්‍රධාන සංවිධායක යන තනතුරු නීත්‍යානුකූල තනතුරු නොවන බව එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, එකී තනතුරු සඳහා ලබාදෙන වරප්‍රසාද, වියදම් කරන මුදල් නීත්‍යානුකූල නොවන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, එම නීත්‍යානුකූල නොවන තනතුරු අත්හිටුවීමට සහ වැය කරන මුදල් නතර කිරීමට අවශ්‍ය පියවර ගෙන තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0237/'09

ගරු ජේමසිරි මානගේ මහතා,— තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2000 වර්ෂයේ ජුනි මස සිට 2009 මාර්තු මස 31 දක්වා කාලය තුළ තැපැල් දෙපාර්තමේන්තුවට සේවකයින් බඳවා ගැනීමක් සිදුකළේද;

(ii) එසේ බඳවා ගත් සේවක සංඛ්‍යාව හා ඒ කවර තනතුරු සඳහාද;

(iii) එසේ බඳවා ගැනීම සිදුකළේ ගැසට් නිවේදන හෝ පුවත්පත් දැන්වීම් මගින් ප්‍රසිද්ධ කිරීමෙන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත බඳවාගනු ලැබූ ක්‍රියාපටිපාටිය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0230/'09

ගරු ජේමසිරි මානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ජාතිය ගොඩනැඟීමේ අමාත්‍යාංශය භාර කැබිනට් අමාත්‍යතුමාගේ නම කවරේද;

(ii) ජාතිය ගොඩනැඟීමේ කැබිනට් නොවන අමාත්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ජාතිය ගොඩනැඟීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව පසුගිය වසරේ කැඳවූයේ කවර දිනයන්හිද;

(ii) ඉහත උපදේශක කාරක සභාව 2009 වසරේ දී කැඳවනු ලැබුවේද;

(iii) එසේ නම්, ඒ කවදාද;

(iv) ඉහත උපදේශක කාරක සභාව කැඳවනු නොලබන්නේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0205/'09

ගරු ජේමසිරි මානගේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) විදේශ ධීවර යාත්‍රා මගින් මාළු ගොඩබෑමේදී මාළු ශ්‍රේණිගත කිරීමක් සිදුකරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2005 සැප්තැම්බර් මාසයේදී, 2006 මැයි මාසයේදී සහ 2008 දෙසැම්බර් මාසයේදී විදේශ ධීවර යාත්‍රා මගින් මාළු ගොඩබෑමේදී, තුන්වැනි ශ්‍රේණියේ මාළු කිලෝග්‍රෑම් එකක් සඳහා ලංකා ධීවර සංස්ථාව අයකරනු ලැබූ මුදල් ප්‍රමාණය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0094/'09

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2008 දෙසැම්බර් මස 31 වැනි දිනට ශ්‍රී ලංකාවේ ලියාපදිංචි මෝටර් රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහන අතුරින් ඩීසල් වාහන සහ පෙට්‍රල් වාහන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ලියාපදිංචි මුළු පෙට්‍රල් වාහන අතුරින් යතුරුපැදි, ත්‍රීරෝද රථ සහ වෙනත් වාහන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සම්පූර්ණ පෙට්‍රල් අලෙවියෙන්, යතුරු පැදි සහ ත්‍රීරෝද රථ සඳහා කවර ප්‍රතිශතයක් අලෙවි වන්නේද යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ඇ) පෙට්‍රල් මිල අඛණ්ඩව ඩීසල් මිලට වඩා වැඩි අගයක් ගැනීම හේතුවෙන් ත්‍රීරෝද රථ සහ යතුරුපැදිවල ගමන් ගන්නා මඟීන් දැඩි අපහසුතාවයකට පත්වන බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0431/'09

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට සහ රජයට අයත්, මාතලේ දිස්ත්‍රික්කයේ ඉඩම්වලින් කොපමණ ප්‍රමාණයක් දැනට මධ්‍යම පන්තිකයින්ට බෙදා දී තිබේද;

(ii) මෙම ඉඩම්ලාභීන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) ඔවුන්ට ලබා දී ඇති අක්කර ප්‍රමාණය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් කොපමණද;

(iv) මෙම ඉඩම් ලබාදී ඇති පදනම සහ කොන්දේසි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මධ්‍යම පන්තිකයින්ට ලබා දී, වගා නොකරන ලද කැලෑ සහිත ඉඩම් රජයට පවරාගෙන ඉඩම් නොමැති අයට බෙදාදීමට එතුමා පියවර ගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0409/'09

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි පුරප්පාඩු සඳහා මෑතක දී පවත්වන ලද ග්‍රාම නිලධාරීන් බඳවා ගැනීමේ තරඟ විභාගයට ඉදිරිපත් වූ අපේක්ෂකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම තරඟ විභාගයෙන් සමත් වූ සංඛ්‍යාව කොපමණද;

(iii) එම සමත් වූ අයගේ නම් සහ ලබාගත් ලකුණු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අය අතුරින් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ අයගේ නම් කවරේද;

(ii) එම අය සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගත් ලකුණු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම සම්මුඛ පරීක්ෂණයෙන් පත්වීම් ලබාදුන් අයගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) තවත් කොපමණ ග්‍රාම නිලධාරී පුරප්පාඩු සංඛ්‍යාවක් මෙම කොට්ඨාසය තුළ ඉතිරිව තිබේද;

(ii) මෙම පුරප්පාඩු පිරවීම සඳහා ඉදිරියේදී ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0005/'09

ගරු රවි කරුණානායක මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පසුගිය වර්ෂ තුන තුළ විදේශ කටයුතු අමාත්‍යතුමා විසින් කරන ලද විදේශ සංචාර සංඛ්‍යාව කොපමණද;

(ii) සංචාරය කරන ලද රටවල් කවරේද; සහ

(iii) ප්‍රවේශ පත්‍ර සඳහා වියදම් සහ හෝටල් ගාස්තු වෙන් වෙන් වශයෙන් සඳහන් කරමින් ඉහත සඳහන් එක් එක් සංචාරයේ වියදම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම සංචාරවලදී කැටුව යන ලද පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් සහ ඔවුන් සඳහා දැරීමට සිදු වූ වියදම් වෙන් වෙන් වශයෙන් කොපමණද; සහ

(iii) ඉහත සඳහන් එක් එක් විදේශ සංචාරය සඳහා හේතුව කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මේ සඳහා අයවැයෙන් වෙන් කරන ලද දීමනාව කොපමණද; සහ

(ii) එවැනි සංචාර සඳහා සපයනු ලැබූ පරිපූරක වැය ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0386/'09

ගරු රේණුකා හේරත් මහත්මිය,—අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් අයත් වන ග්‍රාම නිලධාරී වසම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වලපනේ නව නගරය තුළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) නව නගර සීමාව තුළ ඇති එම ඉඩම්වල අනවසර පදිංචිකරුවන් සිටීද;

(iii) එසේ සිටී නම්, එම පවුල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම අනවසර පදිංචිකරුවන් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියා මාර්ගය කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) (i) වලපනේ නව නගර සීමාව තුළ රාජ්‍ය ආයතන, රාජ්‍ය නිල නිවාස සඳහා වෙන්කර ඇති ඉඩම්වල වර්තමාන තත්ත්වය කවරේද;

(ii) එම ඉඩම් සම්බන්ධයෙන් අදාළ කොමිෂන් සභාව විසින් මේ දක්වා ගෙන ඇති පියවර සහ ඉදිරියේදී ගැනීමට බලාපොරොත්තු වන පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0387/'09

ගරු රේණුකා හේරත් මහත්මිය,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අනුමත කාර්ය මණ්ඩලය කොපමණද;

(ii) එම තනතුරු දරන අයගේ නම් සහ අදාළ රාජකාරි ලැයිස්තු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දැනට පුරප්පාඩු පවතින තනතුරු හා එම පුරප්පාඩු පවතින්නේ කවදා සිටද;

(ii) එම තනතුරුවල රාජකාරි කටයුතු පවත්වාගෙන යන්නේ කෙසේද;

(iii) පවත්නා පුරප්පාඩු සම්පූර්ණ කරන කාල සීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0531/'09

ගරු පාලිත රංගේ බණ්ඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) බී. එම්. අශෝක ජයසිංහ මහතා වයඹ පළාත් අධ්‍යාපන අධ්‍යක්‍ෂවරයා බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ජයසිංහ මහතා එම තනතුරට පත් වූ දිනය කවදා ද;

(ii) ඒ මහතා එම තනතුරට පත්වී ඇත්තේ වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨතම නිළධාරියා ඔහු නිසාද;

(iii) ඒ මහතා එම තනතුරට පත්වන විට වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව තුළ ඔහුට වඩා ජ්‍යෙෂ්ඨ නිළධාරීන් නොසිටියේද;

(iv) ඔහු එම තනතුරට පත්කිරීම නීත්‍යානුකූල නොවන බව 2005 වයඹ පළාත් සභාවේ විගණන වාර්තාවේ දක්වා තිබේද;

(v) ඒ මහතා, දේශපාලන පළිගැනීම් කමිටු නිර්දේශ යටතේ අධිසේවක සංඛ්‍යා පදනම මත පත්වීම් ලැබුවෙක් ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?